www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහ මැතිවරනයේ ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව අඩුවීම : එලැඹෙන පන්ති සටන් පිලිබඳ ඇඟවුමක්

## Sri Lanka's low voter turnout: A sign of coming class battles

2010 අප්‍රේල් 17

සමස්ත දේශපාලන සංස්ථාපිතය කෙරෙහි මහජන විරෝධයේ තරම පෙන්නුම් කරමින් පසුගිය සතියේ පැවැති පාර්ලිමේන්තු මැතිවරනයේදී ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව වාර්තාගත ලෙස පහත වැටුනු අතර කොලඹ පාලක කවයන් තුල ඉන් ඇති කලේ ඉමහත් තැතිගැන්මකි. ඡන්දය පාවිච්චිකර තිබුනේ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් අඩකට ආසන්න ප්‍රමානයකි. එනම් සියයට 52 ක් පමනි. එය 1989 වාර්තාවූ පහලම අගයට වඩා සියයට 12 ක අඩුවීමකි. යුද්ධයෙන් විනාශයට පත් උතුරේ යාපනය දිස්ත්‍රික්කයේ ඡන්දය ප්‍රකාශ කලේ ලියා පදිංචි ඡන්දදායකයන්ගෙන් සියයට 23 ක් පමනි.

පුලුල්ව පැතිරුනු දේශපාලන පිටස්තර වීමක් මෙම ප්‍රතිඵලය මගින් පිලිබිඹු කරයි. කොලඹ පාලන සංස්ථාපිතය එය වහංගු කිරීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක්ම දරයි. සෑහෙන තරම් ජව සම්පන්න උද්ඝෝෂනයක් ගෙන නොයාම සම්බන්ධයෙන් ආරම්භයේදී විපක්ෂයට දොස් පැවරීමෙන් අනතුරුව, මෙම ප්‍රතිපලය එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ මැතිවරන ගනන්හිලව් සමග සසඳමින් පසුගිය සෙනසුරාදා ප්‍රවාහන ඇමති ඩලස් අලහප්පෙරුම පැවසුවේ, ඡන්දය ප්‍රකාශ කිරීම අඩුවීම "දේශපාලන හා සමාජ ස්ථාවරභාවයෙන් යුත් රටක සාමාන්‍ය තත්වයක්" බවයි.

එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය තුල දේශපාලන සබඳතා සහ සමාජ ආතතීන් අලහප්පෙරුම ප්‍රකාශ කරන අයුරින් ස්ථාවර නොමැත යන කරුන පසෙක තැබුව ද ශ්‍රී ලංකාවේ ප්‍රතිඵලය සාමාන්‍යය තත්වයකට වඩා බෙහෙවින් වෙනස්ය. 2004 පාර්ලිමේන්තු මැතිවරනයේදී සියයට 76ක් ඡන්දය ප්‍රකාශ කලහ. ආන්ඩුවේ සියලු ජයඝෝෂාවන් වෙනුවෙන් ඔවුනට ලැබී ඇත්තේ ඡන්දදායකයන්ගේ මුලු සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමානයක් පමනි. එක්සත් ජාතික පක්ෂය (එජාප), ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ද්‍රවිඩ ජාතික සන්ධානය (ද්‍රජාස) යන ප්‍රධාන විපක්ෂයට ලැබුනේ ඊටත් අන්ත ප්‍රතිඵලයකි.

මැදහත් බවක් පෙන්නුම් කරමින් පසුගිය සති අග *සන්ඩේ ටයිම්ස්* පත්‍රයේ කතුවැකිය වෙන්කොට තිබුනේ මෙම කාරනයටය. එය මෙසේ වැලපෙයි: "ජනතාවගේ හඬ.... නෑසුනු තරම්ය." එමෙන්ම "ආන්ඩුවට ලැබුනු ජන වරම .... විවාදාත්මකය." මැරකම්, රාජ්‍ය යාන්ත්‍රනය මත ආන්ඩුවේ දැඩි ග්‍රහනය වැනි විරුද්ධ පක්ෂ ඉදිරිපත් කල හේතු දැක්වීම් වලින් අනතුරුව එවන් "අවභාවිතයන් අලුත් දේවල් නොවේ"යයි එය නිවැරදිව පෙන්නුම් කරයි. එම පැහැදිලි කිරීම සරලයඃ "ඡන්දදායකයන් වෙහෙසට පත්ව සිටීම හා එපාවීම අවසානයේදී එහි පලිය ගත්තේය." අන් අයුරින් පවසතොත් වරද පැටවිය යුත්තේ ආසන්න මාස වලදී එක දිගට පැවැත්වුනු පලාත් සභා, ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරන වලින් හෙම්බත් වූ ඡන්දදායකයින් මතය.

ජනාධිපති රාජපක්ෂගේ ඒකාධිපති පාලනය සම්බන්ධයෙන් යම් ආකාරයක විවේචනාත්මක ආකල්පයක් පෙන්නුම් කරන *සන්ඩේ ලීඩර්* පත්‍රය සැමදා මෙන්ම මුස්පේන්තු සහගතය. "ප්‍රජාතන්ත්‍රවාදය මිය ගොස් ඇත." යන හිසින් පසුගිය සති අන්තයේ එහි පල වූ කතුවැකිය "එක් පක්ෂයක, වඩාත් නිවැරදිව කිවහොත්, එක් පවුලක" පාලනය ජය ගත්තේ යැයි ප්‍රකාශ කලේය. "රටේ පුරවැසියනට ඇත්තේ එක් තෝරා ගැනීමක් පමනි. එක්කෝ පාලක පවුලට ඔවුනගේ හිත පක්ෂපාතිත්වය, විශ්වාසවන්තභාවය සහ කෘතඥතාවය ප්‍රදර්ශනය කල යුතුය. නැතහොත් සිරගතවීමේ, මරනයේ හෝ බලරහිත වීම හේතුවෙන් වැදගම්මකට නැති පුද්ගලයකු වීමේ අවදානම දරා ගත යුතුය. ප්‍රජාතන්ත්‍රවාදය පුනර්ජීවනය වනු ඇත්තේ

"ජනතාවගේ හදවත් තුල සහ සිත් තුල එය නැවත රඳවා ගැනීමෙන්" පමනි යනුවෙන් පවසමින් එයද වක්‍රාකාරයෙන් ඡන්දදායකයා මත වරද පටවයි. වෙනත් අයුරකින් කිවහොත් ඔවුනගේ ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන්ට පිහියෙන් අනින්නට ඉඩ දී "ප්‍රජාතන්ත්‍රවාදයේ මලගම" ලඟා කර ගැනීම සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව මත වරද පැටවීමය.

ආන්ඩුව සහ විරුද්ධ පක්ෂ සිය ආත්ම තෘප්තිය සඳහා ඉදිරිපත් කරන හේතුදැක්වීම් මෙන්ම මෙරට ලිබරල්වාදයේ බෙලහීන නියෝජිතයන්ගේ අඳුරු අශුභවාදය යන දෙකෙන්ම සැදුම් ලත් මෙම සියලු විකෘත සාධාරනීකරනයන් එක් මූලික කරුනක් වහංගු කිරීම සඳහා යොදා ගැනේ. මෙය ඡන්දදායකයින් "වෙහෙසට පත්වීම" නිසා හෝ ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ ඔවුනගේ සංවේදීභාවයේ අඩුවක් නිසා සිදුවූවක් නොවේ; සරලව කිවහොත් කවර හෝ ධනපති පක්ෂයක් වේවා, පාර්ලිමේන්තු මැතිවරනයන්ගේ සීමිත යාන්ත්‍රනයන් වේවා, තම අවශ්‍යතාවන් ගැන සැලකිලිමත් වනු ඇතැයි ඔවුනට විශ්වාසයක් නැත. ඡන්දය ප්‍රකාශ නොකිරීමෙන් බොහෝ දෙනෙකු තම පිටස්තරවීම, විරුද්ධත්වය සහ කෝපය තුලින් ප්‍රකාශයට පත් කලහ.

දේශපාලන සංස්ථාපිතය කෙරෙහි පලවන මෙම විරුද්ධත්වයේ ගැඹුර දශක ගනනාවක සිවිල් යුද්ධයේ ද පිලිවෙලින් පැමිනි සෑම ආන්ඩුවක් විසින් ම දියත් කෙරුනු ජීවන කොන්දේසි වලට එල්ල කරන ලද ප්‍රහාරයන්ගේ ද ප්‍රතිඵලයකි. බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග නොනවත්වා කරගෙන ගිය යුද්ධය සහ දැවැන්ත සමාජ අසමානතාවයන් සහ දුෂ්කරතා නිර්මානය කල ඔවුනගේ වෙලඳපොල ගැති වැඩ පිලිවෙලවල් හේතුවෙන් යූඑන්පීය සහ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිපය) යන මෙරට ධනවාදයේ ස්ථාපිත පක්ෂ දෙකේම මහජන පදනම් ඛාදනය වී ගොසින් ය. 1990 ගනන් වලදී මෙම පක්ෂ වලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා බොහෝ දෙනෙක් සිංහල ස්වෝත්තමවාදී ජවිපෙට ඡන්දය ප්‍රකාශ කල නමුත් 2004 දී එය ශ්‍රීලනිප ආන්ඩුවට එක් වීමත් සමග විකල්පයක් ලෙස පෙනී සිටීමට එයට තිබූ හැකියාව වේගයෙන් සෝදාපාලු විය.

රාජපක්ෂ යලි ඇරඹූ යුද්ධය සම්බන්ධයෙන් බොහෝ දෙනා විරුද්ධ වුවද පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ ය පරාජය කිරීමෙන් අනතුරුව තම ජීවන කොන්දේසි වර්ධනය වනු ඇතැයි ද පොලිස් මිලිටරි බන්ධනයෙන් නිදහස් වනු ඇතැයි ද පුලුල් බලාපොරොත්තුවක් පැතිර පැවතුනි. එනමුදු, "සාමය සහ සමෘද්ධිය" පිලිබඳ රාජපක්ෂගේ පොරොන්දු බේගල් බව ඉක්මනින්ම දැකගත හැකි විය. නිල දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත් වන ජනගහන ප්‍රතිශතය සියයට 15 දක්වා වැඩි වෙමින් සමාජ අසමානතාව ගැඹුරු විය. රටෙහි ආර්ථිකය නය බරින් මිරිකෙද්දී රාජපක්ෂ විසින් නව "ආර්ථික යුද්ධය"ක් ප්‍රකාශයට පත් කලේ හදිසි නීතිය දිගටම පවත්වා ගෙන යමින් සහ යහපත් වැටුපක් සඳහා සටන් කල කම්කරු කොටස් තලා දමමිනි. යුද්ධයට පිටුබලය ලබා දුන් විරුද්ධ පක්ෂ වලට රාජපක්ෂගේ ව්‍යාපාරික ගැති න්‍යාය පත්‍රය සමග මූලික මතභේදයක් ඇත්තේ නැත.

යුද්ධයේ අවසානය දිවයිනේ සුලුතර දෙමල ජනයාට ව්‍යසනයක් බවට පත්විය. දෙලක්ෂ පනස්දහසකට වැඩි සිවිල් ජනතාව  මිලිටරිය විසින් පාලනය කල රැඳවුම් කඳවුරු තුලට ගාල් කෙරුනු අතර ඉන් 80,000 ක් මේ දක්වාම ඒවායේ රඳවා ඇත. දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ පුරා ස්ථිර හමුදා පාලනයක් ස්ථාපිත කර තිබේ. එල්ටීටීඊයේ හොරනෑව ලෙස ක්‍රියාත්මක වූ ටීඑන්ඒය, කොලඹ සංස්ථාපිතයට යලි ඒකාග්‍ර වෙමින් සිටී. යාපනයේ ප්‍රකාශිත අඩු ඡන්ද ප්‍රතිශතය වනාහි ටීඑන්ඒය කෙරෙහි ඇති පිලිකුල, විශේෂයෙන්ම පසුගිය ජනවාරි මාසයේ පැවති ජනාධිපතිවරනයේදී විපක්ෂ අපේක්ෂක සරත් ෆොන්සේකාට සහයෝගය දීමෙන් අනතුරුව වැඩුනු පිලිකුල, ප්‍රකාශ කෙරෙන මිම්මකි. ෆොන්සේකා යනු දෙමල සිවිල් වැසියන් දහස් ගනනකගේ ජීවිත බිලිගත් කුරිරු යුද්ධය දියත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ජෙනරාල්වරයා ය.

පසුගිය මැතිවරනියේදී වාර්තාවූ ආන්තික වශයෙන් පහත් ඡන්ද දායකයින්ගේ සහභාගිත්වය මගින් පිලිබිඹු කෙරුනු මූලික විරුද්ධත්වය, එලැඹෙන පන්ති අරගලයන් පිලිබඳ ඇඟවුමකි. වඩාත් නරක අතට හැරෙමින් පවත්නා ගෝලීය ආර්ථික අර්බුදයේ බර වැඩකරන ජනතාව මත පටවන ලෙසට කෙරෙන මූල්‍ය ප්‍රාග්ධනයේ ඉල්ලීම හමුවේ, ජීවන කොන්දේසි මත එල්ල කෙරෙන දැවැන්ත ප්‍රහාරයකට ග්‍රීසියේ, යුරෝපයේ සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය මෙන් ම මෙරට කම්කරුවන් ද මුහුන දී සිටියි. ආන්ඩුවේ න්‍යාය පත්‍රයේ අංක එකට පැමින ඇත්තේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉල්ලීම පරිදි එන වසරේ අය-වැය පරතරය

දැනට පවත්නා අගයෙන් අඩක් දක්වා පහත හෙළීමට අවශ්‍ය කප්පාදු පියවර ගැනීම යි.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) පසු ගිය මැතිවරනයට ඉදිරිපත් වූයේ, නව ආර්ථික බර කම්කරුවන් විසින් භාර නොගනු ඇතැයි ද ඔවුන් තම පන්ති අවශ්‍යතා සඳහා සටන් කරනු ඇතැයි ද යන විශ්වාසය මත පිහිටාගෙන ය. දේශපාලනයෙන් පිටස්තර වීම, වෙහෙසට පත්වීම හා නොතකා සිටීම වෙනුවට ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියට ඇත්තේ දේශපාලන අරගලයේ දීර්ඝ ඉතිහාසයකි. 1940 ගනන්වල දැවැන්ත මහ වැඩ වර්ජන හා 1953 හර්තාලය, දිවයිනේ ධනපති පාලනය එහි පදනම් දක්වාම සොලවා ලීය. තම මූලික අයිතීන් රැක ගැනීමේ අභිලාෂයේ අඩුවක් කම්කරු පන්තියට නොමැති නමුදු පැරනි නායකත්වයන්ගේ ද්‍රෝහිත්වය තුලින් පැන නගින්නාවූ නිශ්චිත දේශපාලන ප්‍රශ්න වලට ඔවුන් මුහුන දී සිටී.

ඡන්දය නොදීමේ ඉහල ප්‍රතිශතය මගින් පවත්නා පක්ෂ කිසිවක් වැඩකරන ජනතාවගේ අවශ්‍යතා නියෝජනය නොකරන්නේය යන මූලික පිලිගැනීම ප්‍රකාශ කෙරෙනතාක් දුරට ප්‍රතිඵලය ඉතසිතින් පිලිගැනීමට සිදුවේ. එහෙත් දුරස්තවීම, අතෘප්තිය සහ කෝපය පමනක් නොසෑහේ. ආන්ඩුව අති දරුනු නව ආර්ථික ප්‍රහාරයක් සංවිධානය කරන අතර කවර හෝ විරෝධතාවකට එරෙහිව සියලු මර්දන පියවර මුදා හැරීමට නොපැකිලෙනු ඇත. ඒ අනුව කම්කරු පන්තිය, අන් සියල්ලටත් වඩා, දේශපාලනිකව සූදානම් විය යුතුය. කම්කරු පන්තියට තම පන්ති අවශ්‍යතා වෙනුවෙන් සටන් කල හැක්කේ ආර්ථික හා සමාජ අර්බුදයට වග කිවයුතු ධනේශ්වර පද්ධතියට තමන් බැඳ තබන සියලු දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති සහ හිටපු රැඩිකලුන්ගෙන් මුලුමනින්ම බිඳී වෙන් වීමෙන් පමනි.

කම්කරු පන්තිය මුහුන දී සිටින අන්තරාය වන්නේ දේශපාලන සංස්ථාපිතය සම්බන්ධයෙන් ඔවුනට ඇති වෛරය තම අවශ්‍යතා නියෝජනය කරන තමන්ගේම දේශපාලන පක්ෂයක් ගොඩ නැගීම දක්වා මෙතෙක් පරිවර්තනය වී නොතිබීමයි. සාපේක්ෂ වශයෙන් ගත් කල ඡන්දදායකයන්ගෙන් අතලොස්සක් වුවත් තම ඡන්දය සසපට ලබා දුන්නේ ය. කම්කරු පන්තියේ වඩාත් සවිඥානක නියෝජිතයන් වන්නේ ඔවුන් ය. සසප වනාහි සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී විකල්පයක් සඳහා සටන් වදින එකම පක්ෂයයි. දැන් හදිසි කර්තව්‍යය වන්නේ එලැඹෙන පන්ති අරගල සඳහා අනිවාර්ය නායකත්වය ලෙස සසප ගොඩ නැගීමයි. අපේ වැඩ පිලිවෙල අධ්‍යයනය කරන ලෙසත් අපේ පක්ෂයට බැඳෙන ලෙසත් ධනවාදයේ ව්‍යසනයට එරෙහිව සටන් කිරීම සඳහා මාවත් සොයන කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

කේ.රත්නායක

© www.wsws.org